








**සන්නස පුවත්පතට ලියන ඔබටයි මේ**

පුවත්පත් සඳහා ලිපි බාරගන්නා අවසාන දිනය සෑම මසකම 25 වන දින බව කරුණාවෙන් සළකන්න.

සන්නස පසුගිය කළාපයේ ගායනශිල්පි චන්ද්‍රසේන හෙට්ටිආරච්චි පිළිබඳ ලිපිය ලියන ලද්දේ මහින්ද දිසානායක - දිවුල්ගනේ මහතා බව කරුණාවෙන් සළකන්න




## සාකච්ඡා මේසයේ සටන

# දිනුවේ රජය ද..? කොටි ද?

**සටන් විරාම** ගිවිසුම පිළිබඳව රජය සහ එල්.ටී.ටී.ඊ සංවිධානය අතර තවත් සාකච්ඡාවක් සඳහා අවස්ථාවක් සලසාලමින් දෙපාර්ෂවය අතර පෙබරවාරි 22 සහ 23 යන දිනයන් හි ජිනීවා නුවර පැවැති සාකච්ඡා අවසන්ව ඇත. ඒ අනුව ප්‍රථම සාකච්ඡා වටයේදී සාකච්ඡා කර අවසන් කිරීමට හා එකඟතාවයක් ඇති කර ගැනීමට නොහැකි වූ ළමා සොල්දාදුවන් බඳවා ගැනීම ඇතුළු කාරණා කිහිපයක් පිළිබඳවත් ඊට වෙනස් වන කාරණා සම්බන්ධයෙනුත් ලබන අප්‍රේල් මස 19 දා සිට 21 දා දක්වා නැවතත් ජිනීවා නුවර දී පැවැත්වීමට නියමිත සාකච්ඡාවලදී අවධානය යොමු කිරීමට නියමිතව ඇත.

සාකච්ඡා පැවති ආකාරය දෙපාර්ශවය එහිදී හැසුරුණු අයුරු ඉදිරිපත් කළ කාරණා සහ පැමිණි එකඟතාවයන් පිළිබඳව අවධානය යොමු කිරීමට පෙර කාගේත් අවධානය යොමු විය යුතු සිදුවීමක් දෙපාර්ශවය අතර සාකච්ඡා ඇරඹීමට පෙර පෙබරවාරි 21 දා ජිනීවා නුවර දී සිදුවිය. සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ සභාපතීත්වයෙන් නෝර්වේ ඉවත් කර ස්වීඩන් රාජ්‍ය සඳහා එම අවස්ථාව ලබාදීම එම විශේෂ සිදුවීම වේ. නෝර්වේ රජය එදින පස්වරුවේ නිවේදනය කළ එම තීරණය වෙනත් ලෙසකට හඳුන්වන්නේ නම් එය සාකච්ඡා ඇරඹීමට පෙරම පොදුවේ ශ්‍රී ලංකා රාජ්‍යයත්, ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා සහ ඔහුගේ රජයත් ලැබූ

*<u>එමෙන්ම පසුගිය එක්සත් ජාතික පෙරමුණු රජය යටතේ එවකට පැවති රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර පැවති සාකච්ඡා වට හයේදීම දක්නට නොලැබුණු ආකාරයේ ආත්ම විශ්වාසයක් සහිතව සහ විශ්වාසනීය පදනමකින් යුතුව එල්.ටී.ටී.ඊ. සංවිධානය සමඟ අදහස් හුවමාරු කර ගනිමින් තර්ක විතර්ක කිරීමට නව රජය ඉදිරිපත්ව ඇති බව දක්නට ඇත.</u>*

ජයග්‍රහණයකි. කිරීමට නියමිත එම වෙනසට අනුව ස්වීඩන් ජාතික බ්‍රිගේඩියර් උල්ෂ හෙන්රික්සන් මහතා ලබන අප්‍රේල් පළමු වැනිදා සිට එම ධූරයේ වැඩ භාර ගැනීමට නියමිතව ඇත. එය විශාල ජයග්‍රහයණක් යයි පැවසිය හැක්කේ මෙරට සාම ක්‍රියාවලියේ පහසුකම් සපයන රට ලෙස ක්‍රියාත්මක වන නෝර්වේ රාජ්‍යයටම සටන් විරාම නිරීක්ෂණ කමිටුවේ සභාපතීත්වය හිමිව තිබීම සාධාරණ මෙන්ම සමබර නොවන කටයුත්තක් යයි කාගේත් විවේචනයට ලක්ව තිබුණි. එමෙන්ම එම වගකීම ඉන්දියාව හෝ ආසියාතික රටකට, එසේත් නැත්නම් වෙනත් රටකට ලබාදිය යුතු බවටද බොහෝ පාර්ශවයන්ගෙන් කෙරුණු ඉදිරිපත්වෙද්දී එයට විරුද්ධ වූයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය පමණි. භේද පහසුකම් සැපයීමේ කාර්යයේ නිරතව සිටින නෝර්වේ රාජ්‍යයටම එම ධූරය හිමිවීම එම කටයුතු පහසු කිරීමටත් විශ්වාසයටත් හේතුවන බව කොටි සංවිධානයේ ස්ථාවරය විය. එහෙත් මහින්ද චින්තනය සහිත වත්මන් රජය ඇතුළු බොහෝ පාර්ශවයන් කල්පනා කළේ එය වෙනස් විය යුතු බවයි. බොහෝ දෙනා බලාපොරොත්තු වූ ආකරයට එය සිදුව ඇත. සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමේ සභාපතීත්වය ස්වීඩනයට හිමිව ඇත. එය සටන් විරාම නිරීක්ෂණයේ පවතින අඩුපාඩු මඟහරවා ගැනීමටත් එම ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය තහවුරු කිරීමටත් හේතුවන බව නිසැකය. එය කාලයක් තිස්සේ එක්සත් ජනතා නිදහස් සන්ධානයට අයත් පක්ෂ නියෝජනය කළ මතවාදයක් මෙන්ම විවේචනයක ප්‍රතිඵලයකි. එල්.ටී.ටී.ඊ. සංවිධානය තවදුරටත් සටන් විරාම ගිවිසුම නොතකා හැර කටයුතු කරයි නම් එම සංවිධානය යුරෝපය ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාව තුළ හුදකලා කිරීම සඳහා දැන් වඩාත් පහසු වනවා ඇත. සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමේ නිරීක්ෂණ ඒ සඳහා තවදුරටත් දායක කර ගැනීමේ හැකියාව ලැබී ඇත. නෝර්වේ නියෝජිතයන්ගේ සභාපතීත්වයෙන් සමන්විතව තිබූ සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමේ කටයුතු සම්බන්ධයෙන් දෙගිඩියාවක් පැවතියද දැන් එය තරමක් වෙනස්ව ඒ කෙරෙහි විශ්වාසනීයත්වයක් හට ගන්නා පරිසරයක් නිර්මාණයව ඇත.

කෙසේ වුවද රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර ජිනීවා නුවර පැවති සාකච්ඡාවලදී සියළු ඝාතන නතර කරමින් සටන් විරාම ගිවිසුම ආරක්ෂා කිරීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය සහතික වී ඇත. තවද එම සාකච්ඡාවලදී ඇති කරගත් එකඟතාවයන් දෙපාර්ශවය විසින් ආරක්ෂා කරන්නේද නැද්ද යන්න පිළිබඳව හා එහි ප්‍රගතිය පිළිබඳව ලබන අප්‍රියෙල් මාසයේ පැවැත්වෙන සාකච්ඡා වටයට වාර්තාවක් ඉදිරිපත් කිරීමට සටන් විරාම නිරීක්ෂණ කණ්ඩායමට අවස්ථාවක් ලබාදීම සඳහා එකඟතාවයක් ඇති කර ගැනීමද නොසලකා හැරිය නොහැකි වැදගත්කමකින් යුතු කාරණායකි. මන්ද සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරීමේදී මෙතෙක් වාර්තා තබන අයුරින් කටයුතු කර ඇත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානය මිස රජය නොව එබැවින් එය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සටන් විරාම විරෝධී කටයුතු පාලනය කිරීම සඳහා දමා ඇති කදිම විලංගුවකි.





සාකච්ඡා මේසයේ සමාරම්භක කතාව කරමින් නිමල් සිරිපාල ද සිල්වා ඇමැතිවරයා එල්.ටී.ටී.ඊ. සංවිධානයට එල්ල කළ ප්‍රහාරය සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් මෙන්ම වටිනාකමක් ලැබුණු බව නිසැකය. සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කරමින් එම සංවිධානය ඝාතන සහ පැහැර ගැනීම් කරන බවට එමඟින් ජාත්‍යන්තර ප්‍රචාරයක් ලැබුණෝය. සාකච්ඡා

4 වන පිටට

**සංස්කරණය**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සම්බන්ධිකරණය**

| | |
|---|---|
| **NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055 | **WA** Kapila Hemantha Balage 08 9456 1972 |
| **QLD** Ananada Samaratunga 07 3372 7953 | **ACT** Asoka Nimalasiri 0439 925 241 |
| **SA** Chandta Eeriyagama 08 8331 2318 | **TAS** Anura Seneviratne 03 6327 4259 |

**සන්නස පිරිවර**

| | |
|---|---|
| අනුර හොරේෂස් | Anura Horetious |
| සිසිර දිසානායක | Sisira Dissanayaka |
| ශ්‍රීනාත් මද්දුමගේ | Srinath Maddumage |
| අසෝක සුබසිංහ | Asoka Subasinghe |
| සාලිය ගලප්පත්ති | Saliya Galappaththi |
| වි ක ධර්මබන්ධු | W. K. Dharmabandhu |
| ආචාර්ය විද්‍යානි මනතුංග | Dr Vidyani Manathunga |
| ශ්‍රියාණි මද්දුමගේ | Sriyani Maddumage |
| චන්දි මාපා | Chandi Mapa |
| මහින්ද දිසානායක දිවුල්ගනේ | Mahinda Dissanayaka Diwulgane |

සන්නස පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

සන්නස SANNASA
අපේ උරුමය වෙනුවෙන්

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**Sannasa**
PO Box 172 Reservoir
Vic 3073 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel : 03 9310 4196 /0425 720 932
Fax : 03 9310 5569